**තමන්කඩුව ප්‍රාදේශීය සභාව**

**පොලොන්නරුව දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | විෂයයන් ගණන | වටිනාකම රු. |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 03 | 12,345,565 |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 01 | 113,464 |
| (iii) | අනුචිත හෙළිදරව් කිරීම් | 06 | 6,050,064 |

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇතැම් ආදායම් හා වියදම් විෂයයන් උපචිත පදනම මත ගිණුම් තබා නොතිබුණි.

1.3.3 නොසැසඳුනු ගිණුම්

කසල බදු ලේඛනය අනුව 2010 දෙසැම්බර් 31 දිනට හිඟ කසල බදු වටිනාකම රු. 254,200 ක් වු අතර මුල්‍ය ප්‍රකාශන වලට අනුව එම ශේෂය රු. 255,700 ක් ලෙස දක්වා තිබුණි.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

වර්ෂ කීපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය වු රු. 20,225 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ගැලපීම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 304,920,423 ක් වු ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකුල නොවීම්

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකුල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ (විධි විධාන) පනත | පළාත් පාලන ආයතනවල මාසික දළ පාරිශ්‍රමිකය රු. 25,000 කට වැඩි සේවා නියුක්තියන්ගෙන් රු. 25 ක මුද්දර ගාස්තුවක් අයකළ යුතු වුවත්, සේවා නියුක්තිකයින් 07 දෙනෙකුට අදාලව රු .2,100 ක් වු මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. |
| (ආ) | 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | |
| | රීති 59 | සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් සිදුකර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |

(i) මු.රෙ. 261(1) ගෙවීම් මුදල් පොතේ සටහන් නොකර රු. 5,839,700 ක් ගෙවීම් කර තිබුණි.

(ii) මු.රෙ. 570 සභාවේ 2010 දෙසැම්බර් 31 දිනට රු. 954,400 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) මු.රෙ. 751 සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර ඇතත් 2011 අප්‍රේල් 18 දින වන තෙක් භාණ්ඩ සමීක්ෂණ වාර්තා සකස් කර නොතිබුණි.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,073,804 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,512,866 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2009 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිගය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (අ) | වරිපනම් හා බදු | 7,954 | 5,840 | 2,300 | 8,004 | 6,379 | 1,624 |
| (ආ) | බදු කුලී | 13,308 | 18,466 | 7,647 | 14,250 | 13,610 | 640 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 3,970 | 1 | - | 6,320 | 3,413 | 2,907 |
| (ඈ) | වෙනත් ආදායම් | 90,917 | 47,930 | 14,183 | 20,048 | 5,360 | 14,688 |

2.2.2 උසාවි දඩ
------------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අය කර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු. 15,086,073 ක දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු
---------------

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයවිය යුතු රු. 5,020,628 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය.
--------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. (000) | රු. (000) | රු. (000) | රු. (000) | රු. (000) | රු. (000) |
| පුනරාවර්ත වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 46,571 | 33,335 | 13,236 | 50,600 | 33,058 | 17,542 |
| අනෙකුත් | 64,264 | 35,6 04 | 28,660 | 51,384 | 30,667 | 20,717 |
| උප එකතුව | 110,835 | 68,939 | 41,896 | 101,984 | 63,725 | 38,259 |
| ප්‍රාග්ධන වියදම | 168,300 | 54,130 | 114,170 | 125,521 | 62,264, | 63,257 |
| මුළු එකතුව | 279,135 | 123,069 | 156,066 | 227,505 | 125,989 | 101,516 |

2.4 මානව සම්පත් කළමනාකරණය.
----------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අනියම් හා ආදේශක තනතුරු සඳහා සේවකයන් 38 දෙනෙකු බඳවාගෙන ඔවුන් සඳහා දෛනිකව රු. 17,597 ක මුදලක් ගෙවීම් කරන බව නිරීක්ෂණය විය.

2.5 වත්කම් කළමනාකරණය.

------------------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාවේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 128,605,893 ක් වූ අතර ඉන් තක්සේරු කරන ලද ගොඩනැගිලි වටිනාකම රු. 112,994,000 ක් වූ අතර 2011අප්‍රේල් 07 විගණිත දිනය වන විට තක්සේරු නොකරන ලද ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු .15,611,893 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු. 307,000 ක් වූ යන්ත්‍ර හා උපකරණ 2011 අප්‍රේල් 21 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

2.6 කදුරුවෙල බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම

--------------------------------------------------------------

1998 වර්ෂයේදී කදුරුවෙල බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ වියදම් කර ඇති මුදල රු. 52,617,581 කි. ඉන් රු. 17,890,000 ක්, වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ අතර රු. 34,727,581 ක් බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා විය. වෙළඳ සංකීර්ණය සඳහා වැයවූ මුදල, කඩ කාමර කුලියට දීමේදී එකවර අයකරනු ලබන මුදලින් එකතු කර, එකවර පියවිය යුතු වූ අතර බස් නැවතුම්පල ඉදිකිරීමට අදාල මුදල වර්ෂ 02 ක සහන කාලයක් සහිතව, වර්ෂ 22 කදී ගෙවා අවසන් කිරීමට නියමිත විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට අදාලව ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබාගත් රු. 17,890,000 ක ණය මුදලින් 2010 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවිය යුතු මුදල් රු. 6,618,779 ක් වූ අතර කඩ කාමර කුලියට දීම මගින් එකවර අයකළ යුතු මුදලෙන් තවදුරටත් රු.4,676,155 ක මුදලක් අයකර ගතයුතුව තිබුණි.

(ආ) බස් නැවතුම්පල ඉදිකිරීමට 1998 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබාගත් රු. 34,727,581 ක ණය මුදලින් 2010 දෙසැම්බර් 31 දින වන විට කිසිදු ණය වාරිකයක් හෝ පොළී මුදලක් ගෙවා නොතිබුණු අතර එදිනට පවතින හිඟ ණය ශේෂය රු. 57,654,825 කි. මෙයින් රු. 40,291,035 ක් මේ දක්වා නොගෙවා ඇති පොළී මුදල් වන අතර ඉතිරි රු. 17,363,780 නොගෙවූ ණය වාරික වල එකතුව වේ.

(ඇ) බස් නැවතුම්පල, ඉදිකිරීම සඳහා 2010 වර්ෂයට අදාලව ගෙවිය යුතු පොළී මුදල රු. 2,239,501 ක් හා වාරිකය රු. 1,736,379 ක මුදලක් වූ අතර, මෙම මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ලේඛනයේ දක්වා නොතිබුණි

2.7 කාර්ය සාධනය
------------------

සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර සැලැස්මක් නොවීම
----------------------------------------------------------

(i) 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5(I) ප්‍රකාරව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති කාර්යයන් ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මූල්‍ය, මානව හා භෞතික සම්පත් නිසි කළමනාකරණ ප්‍රවේශයකට යොමුකර ගැනීම සඳහා2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05.2 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් (මූල්‍ය හා භෞතික) පිළියෙල කර නොතිබුණි.

3 පද්ධති හා පාලන
------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය